කොටස් වෙළඳපල

කාර්ය පත්‍රිකා 10.1

11 ශ්‍රේණියේ, ගණිතය II පෙළපොතේ 11,12,13 පිටු හොඳින් කියවා පහත කොටුව තුල දී ඇති වචන වලින් වඩාත් සුදුසු වචන තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

ප්‍රාග්ධනය, කොටස්, කොටස් වෙළඳපල, ආයෝජනය කළ මුදල, කොටසක වෙළඳපල මිල, සමාගම්, කොටස් ගණන, ලාභාංශය, ආදායම, ප්‍රාග්ධන ලාභය, කොටසක්

i) සීමාසහිත සමාගම් වලට ..... සම්පාදනය කර ගන්නේ කොටස් නිකුත් කිරීමෙනි.

ii) ..... යනු ප්‍රාග්ධන ඒකකයකි.

iii) කොටස් මිලදී ගැනීම හා විකිණීම සඳහා පහසුකම් සපයා ඇති ස්ථානය ..... ලෙස හැඳින්වේ

iv) මහජනතාව ව්‍යාපාරයක කොටස් මිලදී ගැනීම සඳහා යොදවන මුදල ..... ලෙස හැඳින්වේ

v) කොටස් මිලදී ගත් ආයෝජකයින් විසින් ඒවා ගත් මිලට වඩා වැඩි මිලකට විකුණන විට ඔහුට ලැබෙන වාසිය ..... වේ

vi) එක්තරා කාලසීමාවක් සඳහා කොටසකට සමාගම විසින් තීරණය කර ගෙවනු ලබන මුදල ..... ලෙස හැඳින්වේ

vii) ප්‍රසිද්ධියේ මහජනතාව වෙත කොටස් නිකුත් කළ හැක්කේ ලයිස්තුගත ..... වලට පමණි

viii) කොටස් වෙළඳපළ හරහා ගනුදෙනු වීමේදී සමාගමක කොටසක් සඳහා තීරණය වන මිල ..... ලෙස හැඳින්වේ

ix) ..... පාලනය කරනු ලබන්නේ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව මගිනි.

x) කොටස් වල වටිනාකම, කොටසක වෙළඳපොළ මිලෙන් බෙදූ විට ..... තීරණය කරගත හැකිය.